# නාට්‍ය හා රංගකලාව

## 07 ශ්‍රේණිය - දෙවන වාරය

## නවවන පාඩම

## නාට්‍ය ගීත ගයමින් රංගනය

- නාට්‍ය ගීයක් ගායනා කිරීමේ දී එම නාට්‍ය ගීතය හොඳින් අධ්‍යයනය කළ යුතු ය. නාට්‍ය කුමක් ද? එම නාට්‍යයේ ගායනය සිදුවන්නේ කුමන අවස්ථාවේ ද? ගයන්නේ කුමන චරිතය විසින් ද? නාට්‍යයේ තේමාව කුමක් ද? ගීතය අඩංගු නාට්‍යය මොන වගේ නාට්‍යයක් ද?

  ❖ නාට්‍ය ගීතයක් ගායනා කිරීමේ දී :

  - එයට අදාළ නාද මාලාවට අනුව නිවැරදි ව ගායනා කළ යුතු ය.
  - එහිදී ගීතයේ වචන ගැන ද සැලකිලිමත් වීම, ඉතා ම නිවැරදි ව සහ නිරවුල් ව වචන උච්චාරණය වැදගත් ය.
  - ගායනය ඉදිරිපත් කරන විට ශ්‍රාවකයන්ට හොඳින් ශ්‍රවනය වන පරිදි ඉදිරිපත් කළ යුතු ය.
  - වචන නාට්‍යයට අදාළ අවස්ථාවට සහ චරිතයට ගැළපෙන අයුරින් ද හැගීම් ප්‍රකාශ වන අයුරින් ද ගායනා කල යුතු ය.
  - නාට්‍ය ගීතය ගායනා කරන විට එයට ගැළපෙන චලන ද ඉදිරිපත් කල යුතු වේ.
  - නාට්‍යයේ ශෛලියට අනුගත ව රංගනය ගොඩනගා ගත යුතු වේ.

### ආලේ බැන්ද මාගේ රම්‍යවන්

ගායනය: නූර්ති ගී
සමන් ද සිල්වා
වේදිකා නාට්‍ය ගීත
සංගීතය: Unknown
පද රචනය: Unknown

ආල බැන්ද මාගේ රම්‍යවන්
ආ... ආල බැන්ද මාගේ රම්‍යවන්
(මේ සුනිමල මගේ දික්තල...//)
ආල බැන්ද මාගේ රම්‍යවන්
ආ... ආල බැන්ද මාගේ රම්‍යවන්....

(අවුරුදු සතක් දුකින
මෙහෙවර කර මෙමා...//)
(ගත් ළඳුන් මගේ
ඇගේ රූපේ බෝ අගේ...//)

ආල බැන්ද...

(යන්නට ගමට මෙදින
මව් පියන් දකින ලෙසින...//)
(තෑගී ලෙසට දැන්
ගෙන යාමි රස කැවුම්...//)

ආල බැන්ද...
www.lklyrics.com

### සෝභාව දේ

ගායනය: රොඩ්නි වර්ණකුල
සංගීතය: Unknown
පද රචනය: Unknown

සෝභාව දේ මෙපුර සිරි විසිතුරු
බලනු මිතුරු මග පියකරු වූ
සුසුදු වලා කැරලි පලසකි මේ
මග දිග ඇතිරූ අහස සූරන මැදුරු

පාර දෙපැත්තේ සොඳුරු සල්පිල් වල
දෙව්ලොව නැති සැප විකුනන්නේ
නුවරු රිසි රිසි දේ ගෙන මසුරන්
තඹයට දෙන්නේ නිබඳ සිත ලතැවෙන්න

සෝභාව දේ.../

(ජේත්තු කාර ලියන් ගත විලවුන් මුහුණ සිඹින්නා
සාටක දූහුල ඉරන් නාරිලතා මල් පුදින්නා)..//
දැසින් අමතන බස් වැසුණු දොරක් විවර කරන්නේ
එළිපිට ඇත අවකෙලි කිසිවෙකු මැසිවිලි නොකියන්නේ

සෝභාව දේ.../

(සැණකෙළි පුරා හදේ නිකිණි අවන්හල් පිබිදෙන්නා
ඇසුවන් දුක් සින්දන ගී සින්දු සවන පිනන්නා)..//
සත හට සෙත සලසා අතකින් මදුවිත පුරවන්නේ
සව්දිය පුරන ළඳක් රකුසු නෙතක් පාප් කපන්නේ

(සෝභාව දේ මෙපුර සිරි විසිතුරු
බලනු මිතුරු මග පියකරු වූ
සුසුදු වලා කැරලි පලසකි මේ
මග දිග ඇතිරූ අහස සූරන මැදුරු)..//
සෝභාව දේ...
www.lklyrics.com

දීකිරි දීකිරි ගෙනාව දීකිරි
මිහිපිට කාටත් ගුණ දෙන දීකිරි...//

පැටියා මෝරපු දෙණ ගෙන් ගත් කිරි
හොඳ හැටි උණු කොට හින්දාගත් කිරි
නැවුම් මුට්ටියේ වත්කල මේ කිරි
පණාමට ලාබයි මං දෙන මේ කිරි

දීකිරි දීකිරි ගෙනාව දීකිරි....

කිරි විකුණාලා කාසි හොයන්නයි
අනාගතේ මාලිගා තනන්නයි
කුමාරයෙක් ගෙදරට කැන්දන්නයි
මුට්ටිය බිඳුනොත් ඔක්කොම ඉවරයි

දීකිරි දීකිරි ගෙනාව දීකිරි....

හිස මගේ දෙදරයි දෙපා රුදා දෙයි
රෑ වෙන්නට පෙර ගෙදරට යන්නයි
පණාමේ කිරි ගෙන පිහිටක් වෙන්නයි
මගේ මංගල්ලෙට ඔහෙලත් එන්නයි

දීකිරි දීකිරි ගෙනාව දීකිරි..../ / /

ගායනය : අනුලා බුලත්සිංහල